

### රාසිං දෙය්යෝ මෙල්බන් වේදිකාවට වඩින වගයි

# මෙපුර සිංහල නාට්‍ය කලාව වර්ධනය කිරීම මගේ අරමුණයි

## තරංග දන්දෙණිය



**තරංග දන්දෙනිය ගේ නවතම නාට්‍ය නිර්මාණය රාසිං දෙයියෝ ජූනි 17 වන දා 3.30 ට සහ 6.30 ට රෝවිල් සෙකන්ඩ්‍රි කොලෙජ් හිදී සහ අගෝස්තු 21 වන දා සවුත් මොරෑන්ග්හි යැන් යින් තියටර් හිදී මෙල්බන් පුරවරයේ වෙසෙන විශිෂ්ට ගනයේ රංග ශිල්ප ශිල්පිණියන් රසක් සමගින් දොරට වඩින වග දන්වන්නේ මහත් සොම්නසිනි.**

තරංග දන්දෙනිය නමැති තරුණ නාට්‍ය අධ්‍යක්ෂවරයා සිය තෙවැනි නිර්මාණය වන රාසිං දෙයියෝ නාට්‍යය පුහුණු වන ස්ථානයට අපට යන්නට හැකි වුණා. සියලු රංග ශිල්ප ශිල්පිණියන් සංගීත වේදීන් එකම පවුලක් සේ මහත් උනන්දුවෙන් උද්‍යෝගයෙන් නාට්‍යය පුහුණු වන ආකාරයත් ඉතා උසස් නිර්මාණයක් මෙල්බන් ප්‍රේක්ශකයන් වෙත ඉදිරිපත් කරන්නටත් දක්වන වෙහෙස දකින විට නාට්‍ය ශිල්පියකු ලෙස මට ඇතිවූ සතුට අති මහත් ය. සන්නස මුහුණට මුහුණ විශේෂාංගය වෙනුවෙන් මම ඔහු සමග පිළිසඳර ඇරඹුවෙමි.

*ශ්‍රීනාත්*
මේ වගේ ඓතිහාසික කතාවක් ඇසුරින් වේදිකා නාට්‍යයක් නිර්මාණය කරන්න හිතුවෙ ඇයි?

*තරංග*



ඇත්තටම මේ නාට්‍යයේ නම රාසිං දෙවියෝ වුණාට මම මේ නාට්‍යයේ කතා කරන්නෙ රාජසිංහ රජ්ජුරුවන් ගැන නෙවෙයි. ඒ යුගයේ ජීවත් වුණ මිනිස්සු ගැනයි අපි කතා කරන්නෙ. රාංජසිංහ රජ්ජුරුවො ඉතිහාසයේ සුවිශේෂී චරිතයක්. යුද්ධ කීපයකටම මුහුණ දුන්න රජ කෙනෙක්. පෘතුගීසින් ලන්දේසීන් සහ ඉංග්‍රීසින් සමග සම්බන්ධකම් පැවැත්වූ චරිතයක්. ඒ වගේම අභ්‍යන්තර කැරැල්ලකටත් මුහුණ දෙන්න ඔහුට සිදුවුණා. වැඩිම ජනකතා ගණනක් නිර්මාණය වුණෙත් ඔහු ගැනයි. ඔහු අපූරු චරිතයක් යුද්ධයක් යන අතරෙදි තමන්ට තෑගි වශයෙන් අස්සයෙක් වැනි යමක් ලැබුණම යුද්ධය නවත්වා සාම මාකච්ඡා වලට පවා පෙළඹුණ රජ කෙනෙක්.

රොබට් නොක්ස් ලංකාවෙ හිටියෙ මේ රජතුමාගෙ කාලෙ. ඔහුගෙ සටහන් වලත් මහාවංශයෙත් තියෙන කරුණු මේ කතාව ගොඩ නගනකොට අපට වැදගත් වුණා. මේ යුගයෙ හිටිය මනුස-සයෙක් හදිසියෙම අලුත්ම ආගමක් නිර්මාණය කරනවා. ඔහු රජ්ජුගේ ප්‍රසාදයත් කාලයක්ම දිනා ගෙන ඉන්නවා. ඉන්පස්සෙ පහත රටට පැනලා ගිහින් තමන් රජ්ජුගේ සහෝදරයෙකුගෙ පුතෙක් ලෙස පෙනී සිටිනවා. ඔහු ලන්දේසීන්ටත් මේ බව කියනවා. කාලයක් ලන්දේසීන් සමග ජීවත් වන ඔහු පසුව රාංජසිංහ රජ්ජුගේ නියමයෙන් මරා දැමෙනවා. මෙන්න මේ කතාව මේ නාට්‍යය රචනා කිරීමේදී අපට පිටුවහල් වුණා.

*ශ්‍රීනාත්*
මේ වගේ ඓතිහාසික නාට්‍යයක් වේදිකාවට ගෙන එන්න ඔබ යොදා ගන්නා ආකෘතිය මොන වගේ එකක්ද?

*තරංග*
මේ නාට්‍යයේ මම විශේෂයෙන් පාවිච්චි කරනවා ජන රංග ශෛලිය. මෙය ට්‍රැජි කොමඩි කියන රංග ශෛලියට අනුගතයි. දාරියෝ ෆෝ ගෙ නාට්‍ය වලත් මෙය භාවිතා වෙනවා. මිනිස්සුන්ගේ දුක ප්‍රතිනිර්මාණය කරන ගමන් ප්‍රේක්ෂකයාට හාස්‍ය රසයක් ලබා දෙනවා. නමුත් නාට්‍යය නරඹා ගෙදර ගියාම ප්‍රේක්ෂකයන්ටම වැටහෙනවා තමන් සිනාසුණේ මිනිස්සුන්ගෙ දුක් වේදනාවන්ට නේද කියන කාරණය. මේක චාලි චැප්ලින්ගෙ නිර්මාණ වලදිත් අපට දැකගන්න පුලුවන්. ඒ වගේම මම මේ නාට්‍යයට වාර්තා රංගන ශෛලියකුත් යොදා ගත්තා.

*ශ්‍රීනාත්*
මෙහි රංග කාර්යය සඳහා කීදෙනෙක් එකතු වෙනවද?

*ශ්‍රීනාත්*
මෙය අප දන්නා හැටියට ඔබේ තුන්වන නාට්‍ය නිර්මාණය

*තරංග*
මෙය මගේ තුන්වන දීර්ඝ නාට්‍යයයි

*ශ්‍රීනාත්*
ඔබේ පළමු නාට්‍යය සම්මානයටත් පාත්‍ර වූ බව මට මතකයි

*තරංග*
ඔව් එයට රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නැගී එන අධ්‍යක්ෂවරයා ලෙස සම්මාන ලැබුවා. යව්වන සම්මාන උළෙලේදී හොඳම පිටපත් රචනය වෙනුවෙන් සම්මාන ලැබුණා.

## රට කියන්නෙ මමයි බොල.. යක්කුත් දෙයියොත් ඉන්නෙ රටේ සීමාවෙ..

*තරංග*
මේ නාට්‍යයේ භූමිකා 30 ක් පමණ තිබෙනවා. නලුනිළියන් 18 දෙනෙක් මෙහි රඟපානවා. සංගීත ශිල්පීන් පෙළ කියවන්නන් ඇතුළු සියලු දෙනාම ගත්තම තිහකට ආසන්න පිරිසක් මේ කටයුත්තට සම්මාදම් වෙනවා.

*ශ්‍රීනාත්*
අපේ සංගීතඥ තරුපති මුණසිංහගේ මියුරු නාට්‍යෝචිත සංගීත නිර්මාණයක් මේ නාට්‍යය වෙනුවෙන් නිර්මාණය කළ බව මම දන්නවා. ඔබට මේ නාට්‍යය සඳහා ප්‍රවීණ ශිල්පීන් රැසක් සහය දෙනවා නේද?

*තරංග*
ඔව් මෙහි සංගීතයෙන් මුල් පෙලේ තරුණ



සංගීතඥයකු වන තරුපති මුණසිංහ අපට සහය දෙනවා. රංගනය සඳහාත් දක්ෂ ශිල්පීන් එක්වෙනවා. රංගනයෙන් එක්වන කුසුම්සිරි ලියනාරච්චි ප්‍රවීණ නාට්‍යකරුවෙක්. භානුක මනෝරත්න වේදිකාවේ සහ රූපවාහිණියේ දස්කම් පෑ දක්ෂ රංග ශිල්පියෙක්. ඒ වගේම මන්ජිත චන්ද්‍රජිත්, ගාමිණී රණසිංහ, විපුල නයනානන්ද සහ මෙහි නම් නොකියවුණ වේදිකාවේ පන්නරයක් ලබා ඇති ශිල්පීන් රැසක් මෙයට එක්වෙනවා. මේ අයගේ කැපවීම මම විශේෂයෙන් අගය කරනවා.

*ශ්‍රීනාත්*
ඔබ මෙල්බන්හිදී නිෂ්පාදනය කළ ඇගමෙම්නන් නාට්‍යය සුවිශේෂී නිර්මාණයක්

*තරංග*
මම ඇගමෙම්නන් නිෂ්පාදනය කළේ මගේ ශාස්ත්‍රපති උපාධි අවසන් පරීක්ෂණය වෙනුවෙනුයි. ලා ට්‍රෝබ් විශ්ව විද්‍යාලයේ.. ඇගමෙම්නන් ග්‍රීක නාට්‍යයක්. මෙහිදී මම යථාර්ථවාදී සහ යථාර්ථවාදී නොවන රංග ශෛලීන් දෙකක් මිශ්‍රකරලා අපේ නාට්‍ය ප්‍රේක්ෂකයන්ට ග්‍රහණය කරගත හැකි රංග රීතියක් පාවිච්චි කළා.

*ශ්‍රීනාත්*
මම මෙහෙම ප්‍රශ්නයක් අහන්න කැමතියි ඕස්ට්‍රෙලියාවේ ප්‍රේකෂකයන් වෙනුවෙන් නාට්‍යයන් නිපදවන් ඔබ හිතුවෙ ඇයි?

*තරංග*
මුලින්ම අපි මෙහි පදිංචියට ආවට පස්සෙ අප ඒ තාක් කරගෙන ගිය නිර්මාණයන් තව දුරටත් ඉදිරියටම කරගෙන යාමේ අවශ්‍යතාවක් අපට ඇතිවෙනවා. අනෙක් කාරණය තමයි ඔස්ට්‍රේලියාව වැනි බහු සංස්කෘතික රටක සිංහල නාට්‍ය කලාව ගැන කතා බහක් ඇති කිරීම. මොකද අනෙක් ජාතීන්ගේ නාට්‍ය ගැන අපට අහන්න ලැබුණත් සිංහල නාට්‍ය ප්‍රශස්ත මට්ටමින් ආකෘතිය හා අන්තර්ගතය අතින් ඉදිරියට නොආ බවක් පෙනුණා. මගේ නාට්‍ය කිරීමේ අරමුණ තමයි අපේ ප්‍රජා නාට්‍ය කලාව ඉදිරියට ගෙනයාම. මේ සඳහා අපට ගතහැකි මාර්ග කීපයක් තියෙනවා. එකක් තමයි අපේ පැරණි නාට්‍ය ප්‍රති නිර්මාණය කිරීම. අනෙක තමයි රාසිං දෙවියෝ වැනි ස්වතන්ත්‍ර නිර්මාණ ප්‍රේක්ෂකයන් හමුවට ගෙන ඒම. මේ තුළින් අපට හොඳ ප්‍රේක්ෂකාගාරයක් නිර්මාණය කරගන්න හැකි වේ යයි මම හිතනවා.



*ශ්‍රීනාත්*
ඔබේ පියා රෝහණ දන්දෙනිය ප්‍රවීණ කලාශිල්පියා ඔබ ඔහු දකින්නෙ මොන විදිහකටද?

*තරංග*
මගේ කුඩා කාලය වන විට මගේ පියාගේ අවසාන නාට්‍යය නිෂ්පාදනය වී හමාරයි. ඒත් ඔහුගේ ඇසුර මට බොහෝ දේ කියා දුන්නා. කියවන්න විශාල පොත් ගොන්නක් තිබුණා. හරවත් නාට්‍ය බලන්න ඔහු මා කැඳවාගෙන ගියා. ඒ වගේම මගේ අම්මා ගැනත් කියන්නිම ඕනෙ. ඇය නාට්‍ය කරුවන් දෙන්නෙක් නිසාම බැට කෑ කාන්තාවක්. පළමුව

### මුහුණට මුහුණ

**ශ්‍රීනාත් මද්දුමගේ**

තාත්තාගේ නාට්‍ය කලාව නිසා ඇය බැට කෑවා. ඉන්පසුව ඇගේ පුතා වූ මගේ නාට්‍ය කලාව වෙනුවෙන් දුක් විඳින්න ඇයට සිදුවුණා. අම්මාත් තාත්තාත් දෙදෙනාගේම ආභාශය මට ලැබුණා.

*ශ්‍රීනාත්*
ඔබේ බිරිඳ ගැන කතා කළොත්

*තරංග*
අපි දෙන්නම කලාව හැදෑරුවා. නමුත් විශ්ව විද්‍යාලයේදි අපි එක් අවස්ථාවක තීරණයක් අරගෙන පැති දෙකකට වෙන්වුණා. මම නාට්‍ය කලා කරද්දි ඇය වෙනත් විෂයයක් හැදෑරුවා. හැබැයි මගේ නාට්‍ය කලාව වෙනුවෙන් ඇගෙන් ලැබෙන පිටුවහල අති විශාලයි. මගේ නාට්‍ය වෙනුවෙන් ඇය වෙහෙස නොබලා මට උදව් කරලා තියෙනවා. ඇගෙන් ලැබෙන ධෛර්යය මට ඉතාම වැදගත්.

*ශ්‍රීනාත්*
ඔබට සන්නස පාඨකයන් හට කියන්නට වෙනත් යමක් තිබෙනවා ද?

*තරංග*
මම දැක්ක දෙයක් තමයි සන්නස හොඳ ප්‍රගතිශීලී පුවත්පතක් ලෙස ඉදිරියට යන බව. වැදගත්ම දෙයක් තමයි බුද්ධිමත් පාඨකයන් සන්නස වටා ගොණු වී සිටීම. දුර බැහැර රටක සිටිමින් මේ වගේ හරවත් පාඨක පිරිසක් ගොඩ නැගීම සන්න-සෙන් වෙන වැදගත්ම කටයුත්තක්.

*ශ්‍රීනාත්*
යම් කෙනෙකුට ඔබ අමතන්නට අවශ්‍ය නම්?

*තරංග*
මගේ දුරකතන අංකය 0433 707 241 ට අමතන්න පුලුවන්.